ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana ද මැසිනොද් විදුහල කඳාන De Mazenod College Kandana

# ද මැසිනොද් විදුහල, කඳාන
# De Mazenod College, Kandana

## සිංහල හා සාහිත්‍යය

2024.06.06

පළමු වාර පරීක්ෂණය - 2024 | 6 ශ්‍රේණිය | කාලය පැය 02

Learning Resource Center
De Mazenod College
Kandana

➢ ප්‍රශ්න හොඳින් කියවා නිවැරදි පිළිතුර තෝරන්න.

- ඉරි ඇති පදයේ අර්ථය ඇති පිළිතුරු තෝරන්න.

1) මාළුවා ජලයේ ජඹුරට පීනුවේය.
   1. ඉදිරියට
   2. ගැඹුරට
   3. දියට
   4. උඩට

2) ගොවියෝ උදෙන්ම තනන්නේ කුඹුරු කොටන්නයි.
   1. යන්නේ
   2. සූදානම් වන්නේ
   3. අවදිවූයේ
   4. උදැල්ල ගත්තේ

- සමාන පදය තෝරන්න.

3) ඉඩෝරය
   1. උදය
   2. වැසි සමය
   3. නියඟය
   4. රාත්‍රී කාලය

4) පසිඳු
   1. සාගරය
   2. පස
   3. ප්‍රසිද්ධ
   4. ජනතන

- විරුද්ධ පදය තෝරන්න.

5) ආගන්තුක
   1. ආගම
   2. අවිවේකී
   3. ජාතිය
   4. නේවාසික

6) ප්‍රීතිය.
   1. ශෝකය
   2. සොම්නස
   3. සතුට
   4. පවන

- නිවැරදි පිළිතුර තෝරන්න.

7) අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන කීයද ?
   1. 5කි
   2. 60කි
   3. 42කි
   4. 10කි

8) ස්වරයක් මුලට යොදා ඇති වචනය කුමක්ද ?
   1. තරුව
   2. පාලම
   3. ගිනි
   4. ඊදණ්ඩ

9) 'ශරීර' යන පදයේ ඇති පිල්ලම කුමක්ද ?
   1. ඇලපිල්ල
   2. පාපිල්ල
   3. කොම්බු දෙක
   4. දිගු ඉස්පිල්ල

10) 'රුවන' යන පදයේ ඇති පිල්ලම කුමක්ද ?
   1. ඇලපිල්ල
   2. කෙටි පාපිල්ල
   3. ඉස්පිල්ල
   4. කෙටි ඇලපිල්ල

11) පහත පදවලින් ඒකවචන නාම පදයක් නොවන්නේ කුමක්ද ?
1. බල්ලෙක්
2. කම්කරුවා
3. උපාසිකාවන්
4. ඌරෝ

12) පහත පද වලින් බහුවචන නාම පදයක් වන්නේ,
1. නිවාස
2. පාසල
3. ලේනා
4. ගෙවිලිය

13) අපි, නුඹලා, මම යන පද වලින් ලියන වාක්‍ය අවසන් වන අකුරු පිළිවෙලින් යොදා ඇති පිළිතුර වන්නේ,
1. හු, වි, වූ
2. මු, හු, මි
3. හු, මු, මි
4. මි, හු, මු

14) හෙදිය රෝගියාට බෙහෙත් ........................... හිස්තැනට සුදුසු අතීත කාල ක්‍රියා පදය කුමක්ද ?
1. දමන්නීය
2. ඇමුවේය
3. දමන්නෝය
4. ඇමුවාය

15) ..................... මහන්සි වී වැඩ කරන්නේය. ඉහත හිස්තැනට අදාල උක්ත පදය වන්නේ,
1. ලිපිකරුවන්
2. නුඹලා
3. කම්කරුවෝ
4. ගොවියෙක්

16) ඇත්තු වනයේ සැරිසරති,
ඉර ගසා ඇති පදයේ අනුක්තය වන්නේ,
1. ඇතින්නක
2. ඇතුන්
3. අලියා
4. ඇතෙක්

17) නපුංසකලිංග නාමපදයක් වන්නේ,
1. ගිරවිය
2. ගංගා
3. මසුන්
4. කොටියා

18) අශ්වයා, මොනරා යන පදවලට අයත් ස්ත්‍රීලිංග පද ඇති පිළිතුර වන්නේ කුමක්ද ?
1. වෙළඹ, කෙකිව
2. කෙකිව, වෙළඹ
3. ඇතින්න, කෙකිව
4. කෙකිව, කිකිළි

19) හිස අවුල් කරගෙන
කිළුටු වැරහැලි ඇඳගෙන
පඹයකුගෙ විලසින
ඉදුම් කොහොද නෑ බුක කරමින
මෙම කවියේ සඳහන් අප්‍රාණවාචී නාම පද 2ක් වන්නේ,
1. හිස, කරමින
2. පඹයා, කිළුටු
3. ඉදුම, වැරහැලි
4. හිස, වැරහැලි

20) 'විලසින' යන්නෙහි අර්ථය වන්නේ කුමක්ද ?
1. සිතක්
2. විලාසිතා
3. විලක්
4. ලෙස

(2x20=40)

## II කොටස

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්.

❖ පහත සඳහන් - මාතෘකා වලින් එකක් තෝරාගෙන වචන 1250කට නො අඩු වන සේ රචනයක් ලියන්න.

1. වැඩිහිටියන්ට ගරු කරමු
2. මිහිතක සුරකින - තුරුලිය
3. ජල සම්පත සුරකිමු
4. ජන කවිය අපේ උරුමයයි

❖ පහත සඳහන් පද්‍ය පංතිය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ඉර උදා වන්නට
පළමුව නැගිට සිහි කොට
අලසකම් දුරු කොට
කරන් වැඩපල දියුණු වන්නට

1. ඉහත පද්‍ය පංතිය ඇතුළත් පාඩමේ නම කුමක්ද ?
2. එය උපුටාගත් මුල් කෘතිය කුමක්ද ?
3. එහි කතුවරයා කවුද ?
4. දියුණුවීමට කළ යුත්තේ කුමක්ද ?
5. පහත සඳහන් පදවලට සමාන පද ලියන්න.
   (1) ඉර -
   (2) අලස -

(2x5=10)

❖ පහත පදවල අනුක්ත පදය ලියන්න.

1. ගැමියෝ -
2. මිනිස්සු -
3. හැකැත්තියක් -
4. කුරුල්ලෝ -
5. මම -
6. අපි -
7. බල්ලෙක් -
8. පැල්පත -
9. ගුරුවරු -
10. දැරියක්

(1x10=10)

❖ පහත සඳහන් පාඨ උපුටාගත් ග්‍රන්ථ හා කතුවරු ලියා දක්වන්න.

| | පාඨය | උපුටාගත් ග්‍රන්ථය | කතුවරයා |
|---|---|---|---|
| 1 | මේ තඹ ගෙතියන්නේ කොපේ නැන්දලැ දිනාට | | |
| 2 | වැඩක නොයෙදූ සිත නරක අතටම පෙරළෙන | | |
| 3 | එතැන් සිට රෑ හතවන තුරු උදුනෙන් නගින ගින්න නොනිවේ | | |
| 4 | මහ වනය රාත්‍රී කාලයේ ශාන්ත හෝ නිශ්චල නොවේ | | |
| 5 | හරි යෝධයා මා නොව මුවන්තිස්ස කුමාරයයි | | |

(2x5=10)

❖ උපන් දිනය සමරන ඔබේ කුඩා සොහොයුරාට පිළිගැන්වීමට සුදුසු සුබ පැතුම් පතක් සකස් කරන්න.

(10)

❖ හිස්තැනට සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. ළමයි පාඩමට අදාල අභ්‍යාස ........................ ( කරයි / කරති )
2. ගුරුතුමා විශ්‍රාම ................................ ( ගියාය / ගියේය )
3. මම නුවර පෙරහැර බලන්නට ........................ (ගියෙමු ගියෙමි )
4. උපාසිකාවෝ විහාරයට ................................( ගියෝවු/ ගියෙමි )
5. ගස් ඉළුගඩ කඩා ........................ ( වැටෙති / වැටෙයි )